# නර්තනය - 9 ශ්‍රේණිය

## (පළමු වාරය )



The National e-learning Portal for the General Education

නර්තනය - 9 ශ්‍රේණිය

ඒකකය - ජන ගායනා වල සමාජීය හා සංස්කෘතික පසුබිම හඳුනා ගනිමු.

පැවරුම් අංක 5





## කඩතුරා කවි ගායනා වල සමාජීය හා සංස්කෘතික පසුබිම

උඩරට, පහතරට හා සබරගමු යන සම්ප්‍රදාය තුනටම පොදු ගායනා විශේෂයකි. බෞද්ධාගමික මුහුණුවරක් ගායනා වල අන්තර්ගතව ඇත. ශාන්ති කර්ම වලදී සුදු පිරුවටයක් ලෙස රංග සැරසිල්ල ආවරණයට භාවිත කරන තාවකාලික ආවරනය කඩතුරාව ලෙස හැඳින් වේ. විවිධ වූ නාද මාලා අනුව මෙම කවි ගායනය කෙරේ.

- ග්‍රාමීය ජන සමාජයේ අවශ්‍යතා පූර්ණ කිරීමට යොදා ගනී.
- විශේෂයෙන් සෙත් ශාන්තිය අපේක්ෂාවෙන් කෙරෙන ගෘහස්ත හා පොදු ශාන්ති කර්ම වලටද යොදා ගනී.
- සමාජ විශ්වාසය හා බැඳුනු මානව ආකල්ප මගින් මේවාට ප්‍රමුඛ බවක් ලබා දිනි.
- කවි ගායනා වල බෞද්ධාගමික ලක්ෂණ ඇතුලත්ය.
- සිංහල සංස්කෘතිය හා බැඳුණු සාරධර්ම, චාරිත්‍ර විධි ඇතුලත් අවස්ථා වලදී මේවා භාවිත වී ඇත.

### මාත්‍රා 03 තාලය

| | |
|---|---|
| සිහින් සිනිඳු සලුව පැලඳ විත් උන් | මරහන |
| වහන්ස නුඹ අප අතහැර මන්ද | මහණවුණ |
| අහංකාර ඒ මරහන දැක්කා | බුදුගුණ |
| මිහින්තලා දාතු බලෙන් කඩතිර | අරිමින |

සිද්ධ මුණිඳු වැඩ හිඳ බෝමුල        විදූරාසන

යුද්ධ කරන්නට දස බිම්බර විත්        පැරදුන

වැද්ද නොදී හැම පිරිපත දුරලා        හරිමින

බුද්ධ රත්න අනුහසයෙන් කඩතිර        අරිමින

**ගොයම් කැපීමේ ගායනා වල සමාජීය හා සංස්කෘතික පසුබිම**





කෘෂිකාර්මික ජන සමාජය තුල ජීවත් වූ මිනිසා තම වෘත්තිය ලෙස වී ගොවිතැන යොදා ගෙන ඇත.

මෙම කාර්යයෙහි යෙදෙන ගොවියො තම ශරීරයට දැනෙන වෙහෙස, මහන්සිය, විඩාව, පාළුව මග හරවා ගැනීම පිණිස ගොයම් කැපීමේ කවි ගායනා කරයි. මෙය ගැමි ජනතාවගේ සහජීවනය ඉස්මතු කරන සාමූහික ක්‍රියාවලියකි. ගැමි සමාජයේ දක්නට ලැබෙන සමාජ සාරධර්ම මෙන්ම ඔවුන් තුල පවතින විශ්වාසය පහත කවි වලින් ගම්‍ය වේ. සරල තාල රූප හා නාද මාලා අනුව ගැමි බස් වහර පිලිබිඹු වන පරිදි මෙම කවි නිර්මාණය වී ඇත.

රන් දැකැති ගෙන නිති        සැරසෙනවා

රත්රන් පටි ඉන වට        දිලිසෙනවා

රිවි දුටු පිණි බිඳු ලෙස පහ        වෙනවා

දුම්බර කෙතෙ අපි ගොයම්        කපනවා

| | |
|---|---|
| ඉරු දෙවියන්ගේ ඉර ගල | ගාවා |
| සඳ දෙවියන්ගේ සඳ ගල | ගාවා |
| ගණ දෙවියන්ගේ කෝවිල | ගාවා |
| අපිත් කියමු කවි ගොවිපළ | ගාවා |

| | |
|---|---|
| උදේ සිටන් වකුටු කොන්ද දිග | හැරපල්ලා |
| අතේ තියෙන ගොයම් මිටිය බිම | දමපල්ලා |
| හිසේ තියෙන ලෙන්සු පොඩි අතට | ගනිල්ලා |
| සතර වරම් දෙවි පිහිටෙන් ගොඩ | පලයල්ලා |

| | |
|---|---|
| එපා කියන තැන තැන | නොසිටිල්ලා |
| පිපාසනම් දියවර | බීපල්ලා |
| අපාසු නම් සෙවනේ | සිටපල්ලා |
| කපා ගොයම් කඩිනම් | කරපල්ලා |

**පත් නෙළීමේ කවිවල සමාජීයය හා සංස්කෘතික පසුබිම**





පන් කර්මාන්තයට අදාලව පන් නෙලීමේ කවි නිර්මාණය වී ඇත. ගැමි ජනයා තුල පවතින සාමූහිකත්වය, එකමුතු බව හා සුහදතාව මෙම කවි ගායනා මගින් විද්‍යා මාන වේ. ඇතැම් ශාන්ති කර්ම වල පන් නෙලීමේ කවි ගායනා අන්තර්ගත වී ඇති අතර ඒවා සරල තාලයකින්ද නාද මාලාවකින්ද යුක්ත වේ.

**මාත්‍රා 03 තාලය**

ගාන තෙල් සඳුන් වරලස ඔමරි කොට
මුහුණ පුරා තෙල් ගාගෙන යන කලට
මාන බලති මිනිවන් පන් තිබෙන කොට
නැනො නුඹත් එනවද පන් නෙළන්නට

කොනින් කොනට පන් උදුරා ගන්නේ
තැනින් තැනට පන් අහුරු දමන්නේ
අනුන්ගෙ පන් කොළ එක් නොකරන්නේ
බැණුන් අහන්නට වෙයි දැනගන්නේ

**මාත්‍රා 03 තාලය හෝ මාත්‍රා 2+4 දෙතිත හෝ තාලය**

ඉර සඳ පාන විල කොතැනද තුන්හිරියා
ඉර සඳ පාන විල මෙතැනයි තුන්හිරියා
පන් කම් කරන අහනෝ කාටත් සරියා
මට පැදුරකට පන් දෙනවද තුන්හිරියා

## සොකරි කවි වල සමාජීය හා සංස්කෘතික පසුබිම





උඩරට වන්නි ගැමි සමාජයෙහි ප්‍රචලිත සොකරි නාටකයේදී මෙම කවි ගායනය කරනු ලබයි. සොකරි නාටකයේ අන්තර්ගත චරිත මූලික කොටගෙන එහි කතා ප්‍රවෘත්තිය විකාශනය වන්නේ කවි ගායනා මගිනි.එබැවින් සොකරි නාටකයෙහි ආරම්භයේ සිට අවසානය දක්වාම කවි ගායනා කරනු ලැබේ. ඒවා සරල ඒකාකාරී නාද රටාවකින් යුක්ත වේ. සියලුම කවි ගායනා කරනු ලබන්නේ මාත්‍රා 03 තනි තිතිට අයත් "දොං ජිජි ගත" බෙර පදයේ තාලයට අනුවය.

වෙදා නටන්නේ පළමුව සබයට එන්නේ

යොදා කියන්නේ තාලෙට ගත වෙවුලන්නේ

කුදා වැනෙන්නේ සබයේ කොක් හඬලන්නේ

විදා පාන්නේ අත් දෙක තැගි තියන්නේ

| | |
|---|---|
| සොකරි එන්නී සබයෙන් අවසර | ගන්නී |
| නැටුම් නටන්නී තාලෙට රාග | තියන්නී |
| පද අල්ලන්නී පියයුරු ළැම | සොලවන්නී |
| කැඩපත ගන්නී සුරතින් මුහුණ | බලන්නී |

| | |
|---|---|
| ලාහක් විතර වී අවුවේ | වනාලා |
| දොළසක් විතර පෙති ගොමර | ඉසීලා |
| අතක් දිගට නිල් වරලස | මුදාලා |
| සොකරි සිටී වී අව්වේ | වනාලා |

ක්‍රියාකාරකම

1. කඩතුරා කවි වල සංස්කෘතික පසුබිම විස්තර කරන්න.

2. කඩතුරා, ගොයම් හා පන් කවි භාවිතයට ගන්නා අවස්ථා නම් කරන්න.

3. ගැමි සමාජයේ දක්නට ලැබෙන සමාජ සාරධර්ම මෙන්ම ඔවුන් තුල පවතින විශ්වාස පෙන්නුම් කරන ගායනා මොනවාද? ඒවා ලියන්න.